සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....

ව්‍යාපාර අධ්‍යයනය - I

කාලය පැය 02 යි

<u>උපදෙස්:-</u>

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

ප්‍රශ්න අංකය	ලකුණු
01 - 30	
31 - 50	
එකතුව	

(01) ව්‍යාපාරයක් යනු,

(1) වෙළඳාම හා කර්මාන්ත වල එකතුව යි. (2) වෙළඳාම හා උපකාරක සේවා වල එකතුව යි.
(3) කර්මාන්ත හා උපකාරක සේවා වල එකතුව යි. (4) කර්මාන්ත හා වාණිජ්‍ය යි.
(5) උපකාරක සේවා හා වාණිජ්‍යය යි. (......)

(02) කිසියම් නිෂ්පාදිතයක ''වටිනාකම'' ගණනය කළ හැකි සමීකරණය වන්නේ,

(1) ප්‍රතිලාභ + පිරිවැය (2) ප්‍රතිලාභ - පිරිවැය (3) ප්‍රතිලාභ ÷ පිරිවැය
(4) ප්‍රතිලාභ x පිරිවැය (5) පිරිවැය - පිරිවැය (......)

(03) නව ව්‍යාපාර ප්‍රවණතාවක් නොවන්නේ,

(1) ගෝලීයකරණය. (2) මහා පරිමාණ නිෂ්පාදනය.
(3) විද්‍යුත් ගනුදෙනු (4) හරිත නිෂ්පාදන.
(5) ව්‍යාපාර කටයුතු බාහිර ආයතන මගින් කරවා ගැනීම. (......)

(04) නිෂ්පාදිත වර්ගීකරණයේ ගලායෑම හා එයට අදාල උදාහරණය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) ස්පෘශ්‍ය → භාණ්ඩ → කල්නොපවතින - මෝටර් වාහන.
(2) ස්පෘශ්‍ය → භාණ්ඩ → පාරිභෝගික සේවා - ප්‍රවාහනය.
(3) අස්පෘශ්‍ය → සේවා → ඍජු සේවා - රක්ෂණය.
(4) අස්පෘශ්‍ය → භාණ්ඩ → භාවිතය අනුව - ගෘහ භාණ්ඩ.
(5) අස්පෘශ්‍ය → සේවා → වාණිජ සේවා - සන්නිවේදනය. (......)

(05) ව්‍යාපාරයකට සමාජ තිරසර බව තහවුරු කිරීමට සිදුකළ හැකි ක්‍රියාකාරකමක් වන්නේ,

(1) කුසලතා බලගැන්වීම ය. (2) නවෝත්පාදන හඳුන්වා දීම ය.
(3) අවදානම් කළමණාකරණය කිරීම ය. (4) අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ය.
(5) මානව අයිතිවාසිකම් සුරකීමට දායක වීම ය. (......)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(06) පහත දැක්වෙන්නේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන රාජ්‍ය අංශ හා රජය එල්ල කරනු ලබන බලපෑම් සඳහා නිදසුන් කීපයකි.

X (රාජ්‍ය අංශය)	Y (බලපෑම් සඳහා නිදසුන්)
A - මධ්‍යම රජය B - පළාත් සභා C - පළාත් පාලන ආයතන	1. වරිපනම් බදු අය කිරීම. 2. විදුලි බලය සැපයීම. 3. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම. 4. මාර්ග නඩත්තුව. 5. වී මිලදී ගැනීම. 6. ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.

ඉහත X හා Y නිවැරදිව ගළපා ඇති වරණය වන්නේ,

(1) A - 2,5 B - 4, 6 C - 1, 3
(2) A - 1,4 B - 5,6 C - 2,3
(3) A - 2,4 B - 3,5 C - 1,6
(4) A - 5,6 B - 1,3 C - 2,4
(5) A - 4,5 B - 3,6 C - 1, 2 (......)

(07) රජයේ අරමුණු ඉටු කිරීමට ව්‍යාපාරයක් දායක වන්නේ,

(1) පරිසරයට වන හානිය අවම කිරීමෙ නි. (2) පූර්ණ සේවා නියුක්තිය ඇති කිරීමෙ නි.
(3) පාරිභෝගික ආරක්ෂණය සහතික කිරීමෙ නි. (4) ආර්ථික ස්ථායිතාව ඇති කිරීමෙ නි.
(5) වෙළඳපොල තුළ තරගකාරිත්වයක් පවත්වා ගැනීමෙ නි. (......)

(08) වරලත් හිමියාට හා වරලත් ලාභියාට ව්‍යාපාර ක්‍රමයෙන් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක් වේ.

A - විශාල ව්‍යාපාරයකට පිවිසීමට හැකි වීම.
B - අසාර්ථකවීමේ ප්‍රවණතාව අඩු වීම.
C - වරලත් ගිවිසුමට අනුව වරලත් ලාභියා වගකීම් සපුරාලීම.
D - පුරස්කාරයක් හිමි වීම.
E - මූල්‍ය පහසුකම් ලබාගත හැකි වීම.
F - ව්‍යාපාරය පුළුල් වීම.

ඉහත ප්‍රතිලාභ අතරෙන් වරලත් හිමියාට හා වරලත් ලාභියාට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙනම දක්වා ඇති පිළිතුර වන්නේ,

	වරලත්හිමියා	වරලත්ලාභියා
(1)	A, B, C	D, E, F
(2)	B, C, D	A, E, F
(3)	C, D, E	A, B, F
(4)	B, E, F	A, C, D
(5)	C, D, F	A, B, E

(......)

(09) ''ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යාවසායකත්වය යි.'' ව්‍යවසායකත්වය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ,

(1) විලියම් ඩී. බයිග්‍රේව්. (2) ජෝසප් ෂූම් පීටර්. (3) ඔක්ස්පර්ඩ් ශබ්ද කෝෂය.
(4) අන්තර්ජාතික කම්කරු සංවිධානය. (5) පීටර් එෆ් ඩකර්. (......)

(10) පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ මූල්‍ය අයතන වර්ග කීපයකි.

A - ලංකා බැංකුව B - සම්පත් බැංකුව C - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව D - මහජන බැංකුව

E - ජාතික ඉතිරිකිරීමේ බැංකුව F - හැටන් නැෂනල් බැංකුව G - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

මෙම ආයතන අතුරින් බලපත්‍ර ලාභී විශේෂ බැංකු වර්ගයට අයත් වන්නේ,

(1) A, C හා G ය. (2) C, E හා G ය. (3) B, C හා E ය.

(4) C, D හා F ය. (5) B, D හා G ය. (......)

(11) ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන වර්ග X තීරුවෙන් ද එම වර්ග වලට අයත් මූල්‍ය ආයතන කිහිපයක් Y තීරුවෙන් ද දැක්වේ.

X	Y
A - බැංකු අංශය	1. ප්‍රාථමික අලෙවිකරුවන්
B - තැන්පත් භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන	2. සේවක අර්ථසාධක අරමුදල
C - විශේෂිත මූල්‍ය ආයතන	3. බලපත්‍රලාභී විශේෂ බැංකු
D - ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන	4. බලපත්‍ර ලාභී මුදල් සමාගම්

ඉහත X සහ Y තීරු නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) A - 2, B - 1, C - 4, D - 3 (2) A - 3, B - 4, C - 1, D - 2 (3) A - 4, B - 3, C - 2, D - 1

(4) A - 3, B - 1, C - 2, D - 4 (5) A- 2, B - 4, C - 3, D - 1 (......)

(12) චෙක්පත් රේඛණය කරන ආකාර කිහිපයක් පහත දැක්වේ.



ඉහත රේඛණ අතුරින් විශේෂ රේඛණ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, D, F (2) B, D, F (3) C, E, F (4) C, D, F (5) A, D, E (......)

(13) චරිතගේ මෝටර් රථය රු. 400 000 ක් වටිනා අතර එය රු. 2800 000 කට X රක්ෂණ සමාගමේ සහ 1200 000 කට Y සමාගමේ රක්ෂණය කර ඇත. මෙම මොටර් රථය අනතුරකට ලක් වීමෙන් සිදු වූ අලාභය 1200 000 ලෙස තක්සේරු කර ඇත. එම රක්ෂණ සමාගම් වලින් මෙම මෝටර් රථය සඳහා ගෙවනු ලබන අලාභය නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

(1) X සමාගම රු. 480 000 Y සමාගම රු. 380 000 (2) X සමාගම රු. 840 000 Y සමාගම රු. 120 000

(3) X සමාගම රු. 840 000 Y සමාගම රු. 360 000 (4) X සමාගම රු. 360 000 Y සමාගම රු. 280 000

(5) X සමාගම රු. 280 000 Y සමාගම රු. 120 000 (......)

(14) පහත සඳහන් ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සුරක්ෂිතතාව අඩු වීම විද්‍යුත් වාණිජ්‍යයේ සීමාවකි.

(2) විද්‍යුත් ව්‍යාපාර විද්‍යුත් වාණිජ්‍යයට වඩා පුළුල් ය.

(3) විද්‍යුත් ව්‍යාපාර පදනමට අවතීර්ණ වීමෙන් ව්‍යාපාර ආයතනවලට තම වෙළෙඳපොල පරාසය පුළුල් කර ගත හැකිය.

(4) වේගය, පහසුව හා ගනුදෙනුකරුගේ ඉල්ලීමට අනුකූලවීම, විද්‍යුත් ව්‍යාපාරවල ලක්ෂණ කීපයකි.

(5) විද්‍යුත් ජාල හරහා භාණ්ඩ හා සේවා මිලට ගැනීම හා විකිණීම විද්‍යුත් ව්‍යාපාර ලෙස හැඳින්විය හැකිය. (......)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(15) එක් නිෂ්පාදකයකුගේ භාණ්ඩ පමණක් අලෙවි කිරීමට ගිවිසුම්ගතව ක්‍රියාත්මක වන වෙළෙඳසැල් හැඳින්වෙන්නේ,

(1) විශේෂ වෙළෙඳසැල් ලෙස ය. (2) නානාංශ වෙළඳ සැල් ලෙස ය.
(3) බැඳී වෙළෙඳ සැල් ලෙස ය. (4) ආංශික වෙළඳ සැල් ලෙස ය.
(5) සුපිරි වෙළෙඳ සැල් ලෙස ය. (......)

(16) කළමණාකරණ මට්ටම් හා ඒ ඒ මට්ටමේ දී කළමණාකරුවන් සතු විය යුතු කුසලතා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

(1) අග්‍ර කළමනාකරුවන්ට සංකල්පනාත්මක හා මානව කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ.
(2) පළමු පෙල කළමනාකරුවන්ට තාක්‍ෂණික කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ.
(3) මධ්‍ය මට්ටමේ කළමනාරුවන්ට සංකල්පනාත්මක කුසලතා වැඩි වශයෙන් අවශ්‍ය වේ.
(4) සෑම මට්ටමේ කලමණාකරුවකුට ම තාක්‍ෂණික කුසලතා එකසේ අවශ්‍ය වේ.
(5) සෑම මට්ටමේ කළමනාරුවෙකුට ම මානව කුසලතා එකසේ අවශ්‍ය වේ.

නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) (1) හා (3) පමණි. (2) (2) හා (3) පමණි. (3) (1) හා (4) පමණි.
(4) (2) හා (5) පමණි. (5) (3) හා (5) පමණි. (......)

(17) තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළ පියවර කීපයක් පහත දැක්වේ.

(1) ක්‍රියාත්මක සැලැස්ම සැකසීම. (2) ගැටලුව විශ්ලේෂණය කිරීම.
(3) විකල්ප විසඳුම් ගොඩ නැගීම. (4) විකල්ප විශ්ලේෂණය.
(5) ගැටලුව හඳුනා ගැනීම. (6)හොඳ ම විකල්පය තේරීම.
(7) ඇගයීම හා ප්‍රතිපෝෂණය. (8) සැලසුම ක්‍රියාත්මක කිරීම.

තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලට සඳහන් ව ඇති වරණය තෝරන්න.

(1) 5,7,3,4,2,1, 8, 6. (2) 6, 5, 2, 3, 4, 7, 1, 8 (3) 5, 2, 3, 4, 6, 1, 8, 7
(4) 2, 5, 3, 1, 4, 6, 8, 7 (5) 8, 1, 6, 3, 4, 5, 2, 7 (......)

(18) ''නිමවුමේ ගුණත්වය'' යන්න පැහැදිලි කිරීමක දී ගුරුතුමිය විසින් අසන ලද ප්‍රශනයකට පන්තියේ සිසුන් 5 දෙනෙකු විසින් දෙන ලද පිළිතුරුපහත දැක්වේ.

(1) නිමල් :- පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීමේ දී තරගයට සාර්ථක ව මුහුණ දීමට හැකි භාණ්ඩ හා සේවා නිපදවීමයි.
(2) විමල් :- පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට භාණ්ඩයකට හෝ සේවාවකට ඇති හැකියාවයි..
(3) කමල් :- හානිවීම හා පලුදුවීම් අඩු කර ගනිමින් නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා වේ.
(4) චමල් :- පාරිභෝගික තෘප්තිය උපරිම වන අයුරින් හා ලාභදායකත්වය වර්ධනය වන අයුරින් භාණ්ඩ හා සේවා නිපදවීමයි.
(5) නාමල් :- ආයතනයේ සමස්ත පිරිවැය අවම වන පරිදි නීතිමය තත්ත්වයන්ට අනුකූල ව භාණ්ඩ හා සේවාවන් නිපදවීමයි.

ඉහත පිළිතුරු අතරෙන් වඩාත් නිවැරදි පිළිතුර වනුයේ,

(1) නිමල් (2) විමල් (3) කමල් (4) චමල් (5) නාමල් (......)

(19) භාණ්ඩයක ගුණත්වය අංගෝපාංග කිහිපයකින් සමන්විත ය. එවැනි අංගෝපාංග පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) මනා ක්‍රියාකාරිත්වය / උචිත බව / කල්පැවැත්ම / ආරක්ෂිත බව / ශන්‍ය දෝෂ / සමිතියට අනුකූල වීම.
(2) උචිත බව / ප්‍රමිතියට අනුකූල වීම / ආරක්ෂිත බව / කල්පැවැත්ම / නෛතික බව / ශූන්‍ය දෝෂ
(3) ප්‍රමිතියට අනුකූල වීම / ආරක්ෂිත බව / නෛතික බව / කල්පැවැත්ම / උසස් තතත්වය / මනා ක්‍රියාකාරිත්වය.
(4) නෛතික බව / මනා ක්‍රියාකාරිත්වය / කල් පැවැත්ම / ශූන්‍ය දෝෂ / උචිත බව / විශ්වාසවන්තභවාය.
(5) මනා ක්‍රියාකාරිත්වය / කල්පැවැත්ම / ප්‍රමිතියට අනුකූල වීම / උචිත බව / ආරක්ෂිත බව / විශ්වාසවන්තභාවය. (......)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(20) පහත දැක්වෙන්නේ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වලට අදාල උප විචල්‍ය කීපයකි.

A - අංගෝපාංග B - ගෙවීම් කාලය C - ආවරණය D - ප්‍රචාරණය E - අතර මැදියෝ

F - මාර්ග මිශ්‍රය G - ගුණාත්මය H - පෞද්ගලික අලෙවිය I - සන්නම

J - ප්‍රවාහනය K - ණය කොන්දේසි

ඉහත සඳහන් විචල්‍යයන් අතුරින් ස්ථානයට පමණක් අදාල උප විචල්‍යයන් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

(1) A, C, G සහ I වේ. (2) E, E, F සහ J වේ. (3) C, E, G සහ J වේ.

(4) A, F, H සහ I වි. (5) E. F. H සහ J වේ. (......)

(21) ව්‍යාපාරිකයාගේ දෘෂ්ටියෙන් අලෙවිකරණ මිශ්‍රයෙහි විචල්‍ය X තීරුවේද ගණුදෙනු කරුගේ දෘෂ්ටියෙන් අලෙවිකරණ මිශ්‍රයෙහි විචල්‍ය Y තීරුවේ ද දැක්වේ.

X	Y
A - නිෂ්පාදිතය	1. සන්නිවේදනය
B - මිල	2. පහසුව
C - ස්ථානය	3. පිරිවැය
D - ප්‍රවර්ධනය	4. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා

X හා Y තීරුදෙක නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) A - 3, B - 2, C - 1, D - 4 (2) A - 1, B - 3, C - 4, D - 2

(3) A - 3, B - 2, C - 1, D - 4 (4) A - 2, B - 3, C - 1, D - 4

(5) A - 4, B - 3, C - 2, D - 1 (......)

(22) මූල්‍ය කළමණාකරණයේ දී මූල්‍ය කළමණාකරුවන් විසින් ගනු ලබන වැදගත් තීරණ 2 ක් වන්නේ මූල්‍ය තීරණ හා ආයෝජන තීරණය. එවැනි තීරණ කිහිපයක් පහත දැක්වේ.

A - ලාභාංශ විභජනය පිළිබඳ තීරණ B - ව්‍යාපාර නවීකරණ පිළිබඳ තීරණ

C - වෙළඳ තොග පිළිබඳ තීරණ D - ව්‍යාපාර විවිධාංගීකරණය පිළිබඳ තීරණ

E - ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ F - නැවත ස්ථාපනය පිළිබඳ තීරණ

G - රඳවා ගැනීම පිළිබඳ තීරණ H - ව්‍යාපාර වැඩි දියුණු, කිරීම පිළිබඳ තීරණ

ඉහත සඳහන් තීරණ අතුරින් දිගු කාලීන හා ආයෝජන තීරණ වලට අයත් පිළිතුර වන්නේ,

(1) A, B, C, F (2) B, D, G, H (3) A, D, E, F (4) B, D, F, H (5) B, E, F, H (......)

(23) පහත සඳහන් දෑ අතුරින් අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගයක් වන්නේ,

(1) කල්බදු (2) බැංකු අයිරා (3) අතිරික්ත වත්කම් විකිණීම

(4) කොටස් නිකුතුව (5) බැංකු ණය (......)

(24) පහත දැක්වෙන්නේ මූල්‍ය සම්පාදන මාර්ග වල වාසි කිහිපයකි.

A - අමතර පිරිවැයක් දැරීමට සිදු නොවීම. B - ඉක්මනින් ලබාගත හැකි විය.

C - දිගු කාලීන බැඳීම් නොමැතිවීම. D - කොන්දේසි වලට යටත්වීමට සිදු නොවීම.

E - කළමණාකරණයට සිදුවන බලපෑම අවම වීම.

ඉහත සඳහන් මූල්‍ය සම්පාදන මාර්ග අතරින් කෙටිකාලීන මූල්‍ය සම්පාදන මාර්ග වන්නේ,

(1) B, C, E (2) A, D, E (3) A, C, D (4) B, C, D (5) A, C, E (......)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(25) ආයතනයක සේවකයින් ආකර්ෂණය කර ගැනීමට භාවිත කරන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - රැකියා දැන්වීම් පලකිරීම මගින් B - අන්තර්ජාලය භාවිත කිරීම මගින්

C - අධ්‍යාපන හා වෘත්තීය ආයතන මගින් D - කුසලතා ලේඛණ මගින්

E - අනුප්‍රාප්තිත සැලැස්ම මගින් F - අතීත සේවකයන් මගින්

G - අභ්‍යන්තර ජාල මගින් H - වෘත්තීය සංගම් මගින්

ඉහත සඳහන් මූල්‍ය සම්පාදන මාර්ග අතරින් කෙටිකාලීන මූල්‍ය සම්පාදන මාර්ග වන්නේ,

(1) A, D, G, E (2) A, B, C, E, G (3) A, D, E, F (4) A, E, F, H (5) A, D, F, G (......)

(26) සේවක පුහුණුව හා සංවර්ධනයෙන් සේවා යෝජකයාටත් සේවකයාටත් අත්වන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

A - සේවක කාර්ය සාධනය වර්ධනය වීම. B - රැකියා තෘප්තිය වැඩි වීම.

C - උසස්වීම් ලැබීමේ ඉඩකඩ පුළුල් වීම. D - සේවක පක්ෂපාතිත්වය ඉහළ යාම.

E - සේවක ප්‍රවාසිතාවය අඩු වීම. F - තම අත්හදා බැලීම් සිදු කිරීමට අවකාශ ලැබීම.

G - නිමවුමේ ගුණාත්මකභාවය ඉහළ යාම. H - අතිරේක ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වීම.

ඉහත සඳහන් ප්‍රතිලාභ අතුරින් සේවා යෝජකයාට අත්වන ප්‍රතිලාභ දැක්වෙන පිළිතුර වන්නේ,

(1) AEG හා H (2) ABE හා H (3) ACE හා G (4) ADE හා F (5) ADE හා G (......)

(27) තොරතුරු පද්ධතියක කාර්යය හා උපාංග පාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති සම්මුති නීතිරීති හා ප්‍රතිපත්ති හැඳින්වෙන්නේ,

(1) සපීරාංග (2) ආයතනිකාංග (3) මෘදුකාංග (4) ක්‍රියාපටිපාටි (5) දෘඨාංග (......)

(28) විවිධ මට්ටම් අනුව තොරතුරු පද්ධති වර්ග හා ඒවා පරිශීලනය කරන්නන් පහත වගුවෙන් දක්වා ඇත.

X	Y
A - කළමණාකරණ මට්ටමේ තොරතුරු පද්ධති	1. අධ්‍යක්ෂ මණ්ඩල, සාමාන්‍යාධිකාරි
B - මෙහෙයුම් ,, ,, ,,	2. ගණකාධිකාරීවරු ඉංජිනේරුවරු
C - උපක්‍රමික ,, ,, ,,	3. අලෙවි හා නිෂ්පාදන කළමණාකරුවන්
D - දැනුම් ,, ,, ,,	4. වැඩ පරීක්ෂකවරු ගබඩා භාර කරුවන්.

මෙහි X හා Y තීරු දෙක නිවැරදිව ගලපා ඇති වරණය තෝරන්න.

(1) A - 2, B - 1, C - 3, D - 4 (2) A - 4, B - 3, C - 1, D - 2 (3) A - 3, B - 4, C - 1, D - 2

(4) A - 1, B - 2, C - 3, D - 4 (5) A - 2, B - 4, C - 2, D - 3 (......)

(29) ව්‍යාපාර සැලැස්මක නිෂ්පාදන ක්‍රියා පටිපාටි, නිෂ්පාදන යන්ත්‍ර සහ උපකරණ, අවශ්‍ය නිෂ්පාදන ප්‍රමාණය කර්මාන්ත ශාලාව ස්ථානගත කිරීම යනා දී විස්තර ඇතුළත් කර පිළියෙල කරනු ලබන්නේ,

(1) අලෙවිකරණ සැලැස්ම. (2) මානව සම්පත් සැලැස්ම. (3) මූල්‍ය සැලැස්ම.

(4) මෙහෙයුම් සැලැස්ම. (5) විධායක සාරාංශය. (......)

(30) අලෙවිකරණ සැලැස්මක අන්තර්ගත තරඟකාරිත්ව විශ්ලේෂණයේ දී ඉදිරිපත් කළ යුතු තොරතුරක් නොවන්නේ,

(1) පවත්නා තරඟකාරිත්වය.

(2) තරඟකරුවෝ සහ ඔවුන්ගේ ශක්ති.

(3) තරඟකාරිත්වයට මුහුණ දීමට තමා සතු ශක්තිය හා දුර්වලතා.

(4) වෙළඳපොළට පිවිසීමට ඇති බාධා.

(5) ඒ ඒ නිෂ්පාදිතයේ මෝස්තරය, ප්‍රමාණය, වර්ගය. (......)

- **අංක 31 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට සුදුසු වචන හිස්තැන මත ලියන්න.**

(31) (අ) නිෂ්පාදිතයක මතුපිට සඳහන් Ⓒ සංකේතයෙන් .... යන්න අදහස් කරන අතර Ⓡ සංකේතයෙන් .... යන්න අදහස් වේ.

(ආ) සාධාරණව හා නිත්‍යානුකූලව ව්‍යාපාර කටයුතු කරගෙන යාම හඳුන්වනුයේ....................................... ....ලෙසය.

(32) (අ) ව්‍යාපාර සංයෝජනය විය හැකි ප්‍රධාන ආකාර දෙක ලෙස .... හා .... හැඳින්විය හැක.

(ආ) ව්‍යාපාර සංයෝජනයේ දී සිදුවන ප්‍රධාන සංයෝජන වර්ග ලෙස .... සිරස් සංයෝජන හා .... හැඳින්විය හැක.

(33) (අ) සීමිත පොදු සමාගම් .... හා .... ලෙස ප්‍රධාන කොටස් දෙකකි.

(ආ) රාජ්‍ය සමාගම් වලට හා රාජ්‍ය... වලට නෛතික පුද්ගලභාවයක් පවතින නමුත් රාජ්‍ය .... වලට නෛතික පුද්ගල භාවයක් නොමැත.

(34) (අ) පරිගණක භාවිත කරමින් බැංකු අතර සිදුවන ගනුදෙනු පියවීම සඳහා භාවිතා කරන ක්‍රමය... ලෙස හැඳින්වෙන අතර, මෙය මහ බැංකුව හා වාණිජ බැංකු වලට හවුල් අයිතිය ඇති...විසින් සිදු කරයි.

(ආ) බැංකු ණය ප්‍රධාන වශයෙන් .... හා .... වශයෙන් වර්ග දෙකකි.

(35) (අ) පිටතට නැඹුරු වූ ප්‍රවාහන හා සැපයුම් සේවා .... ආරම්භ වී .... අවසන් වේ.

(ආ) ආයතන වල ස්වරූපය හා නිෂ්පාදිත වල ස්වරූපය අනුව විවිධ ආකාරයේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති පවතී. ඒවා 1. .... 2. .... වශයෙන් ආකාර කීපයකි.

(36) (අ) විදේශ වෙළඳාමේ දී මුදල් ගෙවීම සඳහා බැංකු .... හා .... ලිපිය යොදා ගත හැකි වේ.

(ආ) පාලන ශිල්පක්‍රම... ක්‍රියාවලී පාලනය... ලෙස වර්ග කළ හැකිය.

(37) (අ) යළි ඇණවුම් මට්ටම ගණනය කිරීමට .... X .... සිදු කළ යුතුය.

(ආ) .... නිෂ්පාදන සැලසුම්කරණය, ද්‍රව්‍ය මිලදී ගැනීම, ... හා පර්යේෂණ හා සංවර්ධනය මෙහෙයුම් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් වේ.

(38) (අ) අලෙවිකරණ පරිසරය... හා .... ලෙස කොටස් දෙකකට බෙදේ.

(ආ) මූල්‍ය උපකරණ වල කල් පිරීමේ කාලය පදනම් කර ගෙන මූල්‍ය වෙළඳපොළ .... හා .... ලෙස වර්ග කෙරේ.

(39) (අ) ක්‍රියා විශ්ලේෂණයෙන් ලබා ගන්නා තොරතුරු .... හා .... සකස් කර ගැනීමට ආධාර කර ගැනේ.

(ආ) සංවිධානයක් සිය සේවාදායකයන්ට සෘජුවම ගෙවනු ලබන ගෙවීම... නමින් හැඳින්වෙන අතර, සේවාදායකයින් ගේ විශිෂ්ට කාර්යාල සඳහා කරනු ලබන ගෙවීම්............................ .... ලෙස හැඳින් වේ.

(40) (අ) පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක හෝ අවශ්‍යතාවක් හෝ වුවමනාවක් ඉටු කළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳ ව්‍යවසායකයකු තුළ ඇතිවන සිතුවිල්ල.. ලෙස හැඳින් වේ. එය ....විශ්ලේෂණයට ලක් කළ යුතුය.

(ආ) නිෂ්පාදන ක්‍රියා වලියේ එක් අදියරයක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු දේ එක් ස්ථානයක සිදුවන ආකාරයට පිරියක පිළියෙල කිරීම.. ලෙස හැඳින්වෙන අතර, සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය එක් කාර්ය ස්ථානයකින් ඊළඟ කාර්ය ස්ථානයට රේඛීයව අනු පිළිවෙලට ගලායන ආකාරයට පිරියත සකස් කිරීම.. නම් වේ.

- **ප්‍රශ්න අංක 41 සිට 50 දක්වා වූ ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) පෞද්ගලික අංශයේ ප්‍රධාන ව්‍යාපාර සංවිධාන වර්ග හතරක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(42) රටක ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා හේතු වන සාධක හතරක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(43) විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධක 04 ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(44) ව්‍යාපාර අරමුණක තිබිය යුතු ගුණාංග 04 ක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

(45) කාර්ය නිෂ්පාදනයේ අහිතකර ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(46) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ දී අවධානයට යොමු කරන අංශ 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(47) ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ බැංකුව ලෙස හැඳින්වීමට හේතු වන කරුණු 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(48) රැකියා ඇබෑර්තුවක් පිරවීම සඳහා ඉතාම සුදුසු පුද්ගලයා තෝරා ගැනීමට භාවිත කරන ක්‍රම 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(49) මූල්‍ය කළමණාකරණ ශ්‍රිතයට අයත් තොරතුරු පද්ධති 04 ක් නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

(50) මානව සම්පත් සැලැස්මක ඇතුලත් වියයුතු කරුණු 04 ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023

Third Term Test - Grade 13 - 2023

විභාග අංකයඃ ....

ව්‍යාපාර අධ්‍යයනය - II

කාලය පැය 03 යි

(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

I කොටස

01. (i) ''ව්‍යාපාර'' සංකල්පය නිර්වචනය කිරීමේ දී ආර්ථික කටයුතු පමණක් ව්‍යාපාර ලෙස සැලකෙන අතර ''ආර්ථික නොවන කටයුතු'' ව්‍යාපාර ලෙස නො සැලකේ.
මෙම ප්‍රකාශය උදාහරණ 02 ක් සහිතව පැහැදිලි කරන්න. (ල. 04)

(ii) අ) '' ව්‍යාපාරිකයන්ට වඩාත් වැදගත් වන්නේ අවශ්‍යතා නොව වුවමනාවන්ය.'' ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. (ල.02)

ආ) පහත සඳහන් පාර්ශ්ව ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු දෙක බැගින් ලියන්න.

a. රජය b. ණයහිමියෝ (ල. 02)

(iii) අ) ''තාක්ෂණික පරිසරයේ නිරන්තරයෙන්ම වෙනස්කම් සිදු වේ. '' එකී වෙනස්කම් ව්‍යාපාරවලට එල්ල කරන අහිතකර බලපෑම් 04 ක් ලියන්න. (ල.02)

ආ) දෙආකාරයක නිමැවුම් ලැබෙන සේ ප්‍රතිචක්‍රීකරණය සිදු කළ හැකිය. නම් කර නිදසුන් දෙන්න. (ල.02)

(iv) ව්‍යාපාර සමාජ වගකීම් හා ව්‍යාපාර ආචාර ධර්ම අතර සමීප සම්බන්ධතාවයක් පවතින අතර, ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමේ දී ව්‍යාපාර ආචාර ධර්ම නිතැතින්ම ආරක්ෂා වේ.

අ) ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වේ ද? (ල. 01)

ආ) ඔබගේ පිළිතුර උදාහරණ 03 ක් සහිතව පැහැදිලි කරන්න. (ල. 03)

(v) බිස්කට් නිපදවන ආයතනයක ඒ ඒ ව්‍යාපාර ශ්‍රිත සම්බන්ධයෙන් ආචාරධර්ම අනුගමනය කිරීමේ වැදගත් කම පහත ව්‍යාපාර ශ්‍රිත ඇසුරින් පැහැදිලි කරන්න.

අ) මෙහෙයුම් කටයුතු

ආ) මානව සම්පත් කටයුතු (ල.04)

02. (i) ඕනම රජයකට ලගා කර ගැනීම සඳහා අර්ථික අරමුණු පවතී.

අ) පහත දී ඇති ආර්ථික අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

1. පූර්ණ සේවා නියුක්තිය.
2. ආර්ථික ස්ථායිතාවය. (ල. 02)

ආ) ඉහත ආර්ථික අරමුණු ඉටු කර ගැනීම ව්‍යාපාර දායක වන ආකාරය සඳහා කරුණු 02 ක බැගින් වෙන වෙනම දක්වන්න. (ල.02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ii) ආ) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත අනුව හවුල් ව්‍යාපාර ත්‍රවචනයේ අඩංගු වන හවුල් ව්‍යාපාරයක පැවැතිය යුතු අනිවාර්ය ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) අක්වෙරළ සමාගම් හා විදේශ සමාගම් අතර වෙනස පැහැදිලි කරන්න. (ල.02)

(iii) 2007 අංක 07 දරණ සමාගම් පනත තනි පුද්ගලයෙකුගේ පෞද්ගලික හෝ පොදු සමාගමක් ආරම්භ කිරීම පහසුකම් සලසා තිබේ.

අ) මෙය ''සමාගමක්'' යන මූලික අදහස සමග කොතරම් දුරට ගැලපේ දැයි පෙන්වා දෙන්න.(ල.02)

ආ) සමාගමක් ලියාපදිංචි කිරීමේ දී භාවිතාකරන සාංගමික ව්‍යවස්ථාව ලියේ වැදගත් කම කරුනු 02 ක් මගින් පෙන්වා දෙන්න. (ල.02)

(iv) අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වාගෙනයාමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට බලපා ඇති හේතු 04 ක් සඳහන් කරන්න. (ල.02)

(v) අ) ශ්‍රී ලංකාව වැනි රටවල රටේ සංවර්ධනයට ඍජුව දායක වන විශිෂ්ට ව්‍යවසායකයින් බිහි නොවීමට බලපා ඇති හේතු 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) සමාජ ව්‍යවසායකත්වය හා අභ්‍යන්තර ව්‍යවසායකත්වය ප්‍රායෝගික උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.02)

03. (i) අ) මුදලේ ප්‍රාථමික කාර්යයන් දෙක සඳහන් කරන්න. (ල.02)

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු වල බැංකු කරුවා ලෙස හැඳින්වීමට හේතු 04 ක් සඳහන් කරන්න. (ල.02)

(ii) අ) ඒකක භාරයක දක්නට ලැබෙන ''ආයෝජන කළඹක්'' යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ල.02)

ආ) ආයෝජන කලඹ ආයෝජකයින්ට ප්‍රතිලාභ ලබා දෙන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ල.02)

(iii) අ) වර්තමානයේ වාණිජ බැංකු තරඟකාරීත්වය ජය ගැනීම උදෙසා විවිධ පියවර ගනිමින් පවතී. තරඟකාරිත්වය ජය ගැනීම සඳහා වාණිජ බැංකු ගෙන ඇති පියවර 04 ක් සඳහන් කරන්න. (ල. 02)

ආ) වර්තමානයේ මෙරට බැංකු පද්ධතිය භාවිතා කරන ''හරිත බැංකුකරණය'' යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iv) අ) ව්‍යාපාර වල පැවැත්ම සඳහා රක්ෂණය දායක වන ආකාරය කරුණු 04 ක් මගින් පැහැදිලි කරන්න. (ල.02)

ආ) හානි රක්ෂණයක් ලබා ගැනීමේ දී රක්ෂිතයා විසින් හෙළි කළ යුතු වැදගත් කරුණු 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(v) අ) පාසලක අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා යොදා ගත හැකි වාචික හා වාචික නොවන සන්නිවේදන මාධ්‍ය 02 බැගින් ලියන්න. (ල.02)

ආ) සඵලදායි සන්නිවේදනය යනු කුමක් ද? (ල.02)

04. (i) සැපයුම් දාම කළමනාකරණයේ ප්‍රයෝජන හතරක් නම් කර, ඒවායින් දෙකක් පැහැදිලි කරන්න. (ල.04)

(ii) අ) විදේශ වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා භාවිතා කළ හැකි විද්‍යුත් ගෙවීම් ක්‍රම දෙකක් පැහැදිලි කරන්න. (ල.02)

ආ) විදේශ වෙළඳාමේ ව්‍යාප්තියට එරෙහි තීරු බදු නොවන බාධක හතරක් දක්වන්න. (ල.02)

(iii) වර්තමානයේ සුපිරි වෙළඳසැල් දිනෙන් දින පාරිභෝගිකයන්ගේ ආකර්ෂණය දිනා ගනිමින් ඇති අතර, මංගත ක්‍රමයට (online) භාණ්ඩ මිලදී ගැනීමට ද අවස්ථාව සලසා තිබේ. මෙම වෙළඳසැලකින් මංගත ක්‍රමයට භාණ්ඩ ඇණවුම් කර නිවසටම ගෙන්වා ගැනීම සිදු කළ හැකි ආකාරය දක්වන්න. (ල.04)

(iv) අ) ණයවර ලිපිය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල.02)

ආ) දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (SAARC) සහයෝගීතා කටයුතු ක්ෂේත්‍රයන් නම් කරන්න. (ල.02)

(v) වර්තමාන ශ්‍රී ලංකාවේ වඩාත් කාර්යක්ෂම හා ඵලදායි තොග වෙළඳාමක් සඳහා ''ආර්ථික මධ්‍යස්ථාන'' බෙහෙවින් දායක වේ.

අ) ආර්ථික මධ්‍යස්ථානයක් යනු කුමක් දැයි හඳුන්වා, ආර්ථික මධ්‍යස්ථාන සඳහා උදාහරණ 02 ක් දෙන්න. (ල. 02)

ආ) ලංකාවේ තොග හා සිල්ලර වෙළඳාමේ කාර්‍යක්ෂමතාවය හා ඵලදායිතාවය සඳහා ''ආර්ථික මධ්‍යස්ථාන'' කොපමණ දායක වන්නේ දැයි කරුණු 04 ක් මගින් පෙන්වා දෙන්න. (ල. 02)

II කොටස

05. (i) හෙන්රි මින්ට්ස්බර්ග් විසින් සඳහන් කරන ලද ප්‍රධාන කළමණාකරණ භූමිකා 03 හා ඒවා යටතේ වන උපභූමික 10 වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ල.04)

(ii) සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර අනු පිළිවෙලින් සඳහන් කරන්න. (ල.04)

(iii) පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

- ⋆ අණ කිරීමේ දාමය.
- ⋆ අණ කිරීමේ ඒකීයතාවය.
- ⋆ පාලන විතස්ථිය
- ⋆ අධිකාරිත්වය (ල. 04)

(iv) කම්හල් පිරියන සැලසුම් කිරීම යනු කුමක්දැයි හඳුන්වා, ප්‍රධාන පිරියත සැලසුම් වර්ග 04 සඳහන් කරන්න. (ල.04)

(v) සමච්ඡේද ලක්ෂ්‍යය විග්‍රහයේ දී නිෂ්පාදන ව්‍යාපාර ආයතනයකට ''ආරක්ෂණ ආන්තිකයක්'' (safety margin) පවත්වා ගැනීම අත්‍යාවශ්‍යය වේ.

අ) Safety margin යන්න පැහැදිලි කර ආරක්ෂක ආන්තිකය දළ ප්‍රස්ථර සටහනකින් පෙන්වා දෙන්න. (ල.02)

ආ) ආරක්ෂිත ආන්තිකයක් පවත්වා ගැනීම සඳහා බලපාන කරුණු 04 ක් දක්වන්න. (ල.02)

06. (i) ආර්ථික ඇණවුම් ප්‍රවාහණය යනු කුමක් දැ යි නිර්වචනය කොට ප්‍රස්ථාර සටහනක් ද යොදා ගනිමින් තොග පිරිවැය හා ආර්ථික ඇණවුම් ප්‍රමාණය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ල.04)

(ii) අ) අලෙවිකරුවන් විසින් පහත සඳහන් අලෙවිකරණ සංකල්ප වලදී අවධානයට ලක් කරන ලද කරුණු 02 බැගින් සඳහන් කරන්න.

(1) නිෂ්පාදන සංකල්පය (2) නිෂ්පාදිත සංකල්පය. (ල. 02)

ආ) සඵලදායි වෙළඳපල ඛන්ඩනයක් සඳහා තිබිය යුතු අවශ්‍යතා 04 ක් සඳහන් කරන්න. (ල.02)

(iii) නිෂ්පාදිත මිශ්‍රය යනු කුමක් දැයි හඳුන්වා, එය සමන්විත වන ආකාරය පැහැදිලි කරන්න. (ල.04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iv) ආයෝජකයින් කොටස් වෙලඳපොල තුළ ආයෝජනය කිරීමෙන් සෘජු හා වක්‍ර ප්‍රතිලාභ රැසක් ලඟා කරගත හැකි වේ. (ල.02)

ඇ) කොටස් වෙළඳපොල තුල ආයෝජනයෙන් ආයෝජකයෙකුට ලැබෙන සෘජු ප්‍රතිලාභ 04 ක් හා වක්‍ර ප්‍රතිලාභ 04 ක් වෙන වෙනම සඳහන් කරන්න. (ල.02)

ආ) මෙයින් සෘජු ප්‍රතිලාභ 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

(v) ඇ) විදේශීය ආයෝජකයින් ලෙස මෙරට කොටස් වෙළඳපොලට සම්බන්ධ විය හැකි ආකාරය කෙටියෙන් දක්වන්න. (ල.02)

ආ) විදේශීය ආයෝජකයින් ලෙස මෙරට කොටස් වෙළඳපොලට සම්බන්ධ විය හැකි පාර්ශව 02 සඳහන් කරන්න. (ල.02)

07. (i) ඇ) ව්‍යාපාරයේ හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ වුවකු, එම මූලික අරමුණට අමතරව ඉටු කර ගැනීමට අපේක්ෂා කරන තවත් අරමුණු කීපයක් ඇත. එම අරමුණු සඳහන් කරන්න. (ල.02)

ආ) ව්‍යාපාරයකට දිගු කාලීනව මූල්‍ය සම්පාදනය කර ගත හැකි මාර්ග 04 ක් දක්වන්න. (ල.02)

(ii) මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ල.04)

(iii) සේවක පුහුණුව හා සංවර්ධනය අතර ඇති වෙනස්කම් 04 ක් සඳහන් කරන්න. (ල.04)

(iv) ඇ) සේවාදායක සෞඛ්‍යය හා ආරක්ෂාවේ වැදගත් කම කරුණු 04 ක් දක්වමින් පැහැදිලි කරන්න. (ල.02)

ආ) කාර්මික ආරවුලක් යනු කුමක් ද? යන්න පැහැදිලි කර, කාර්මික ආරවුල් ඇති වීමට හේතු 02 ක් සඳහන් කරන්න. (ල.02)

(v) ඇ) සේවක ආකර්ෂණය යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කර, සේවක ආකර්ශනයේ පියවර අනුපිළිවෙලින් දක්වන්න. (ල.02)

ආ) සේවක ආකර්ශනය සඳහා යොදා ගන්නා අභ්‍යන්තර සේවක ආකාර්ශන මාර්ගයන්හි වාසි 02 ක් හා භාහිර සේවක ආකර්ශන මාර්ගයන් හි අවාසි 02 ක් සඳහන් කරන්න. (ල. 02)

08. (i) ඇ) දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්යයන් මොනවාද? (ල.02)

ආ) හොඳ තොරතුරක ඇතුළත් ගුණාංග 04 ක් සඳහන් කරන්න. (ල.02)

(ii) ඇ) තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ නව ප්‍රවනතාවයන් ලෙස විශාල දත්ත (bigdata) හා පාරදත්ත (metadata) හඳුන්වා දිය හැකිය. විශාල දත්ත හා පාර දත්ත යනු මොනවා දැයි උදාහරණයක් බැගින් සපයමින් කෙටයෙන් පැහැදිලි කරන්න. (ල.02)

ආ) කෘත්‍රිම බුද්ධිය (Artificial intelligence) වර්තමාන ලෝකයේ සීඝ්‍රයෙන් ව්‍යාප්තවන සංකල්පයකි. එක් උදාහරණයක් සපයමින් කෘත්‍රිම බුද්ධිය යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.02)

(iii) ඇ) ඵලදායි තොරතුරු පද්ධතියක් මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන කාර්යයන් 04 ක් සඳහන් කරන්න. (ල.02)

ආ) කළමණාකරණ මට්ටම් අනුව තොරතුරු පද්ධති හා භාවිතය අනුව තොරතුරු පද්ධති අතර අන්තර් සම්බන්ධතාවක් පවතී. එය ගැලීම් සටහනක් මගින් දක්වන්න. (ල.02)

(iv) ඇ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ල.02)

ආ) ව්‍යාපාර සැලැස්මක විධායක සාරාංශය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.02)

(v) ඇ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී මූල්‍ය සැලැස්මක් සකස් කිරීමේ වැදගත් කම කරුණු 04 ක් මගින් සඳහන් කරන්න. (ල.02)

ආ) ව්‍යාපාර සැලැස්මක ව්‍යාපාර විස්තරය තුළ ඇතුළත් විය යුතු තොරතුරු 04 ක් දක්වන්න. (ල. 02)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය - 2023

13 ශ්‍රේණිය | **ව්‍යාපාර අධ්‍යයනය** | **පිළිතුරු පත්‍රය**

I පත්‍රය

1 -(4)	2 -(3)	3 -(2)	4 -(5)	5 -(5)	6 -(1)	7 -(1)	8 -(5)	9 -(3)	10 -(2)
11 -(2)	12 -(4)	13 -(3)	14 -(5)	15 -(3)	16 -(4)	17 -(3)	18 -(2)	19 -(5)	20 -(2)
21 -(5)	22 -(4)	23 -(3)	24 -(2)	25 -(1)	26 -(5)	27 -(4)	28 -(3)	29 -(4)	30 -(5)

(31) (අ) (c) - Copy Righ - ලිපි හිමිකම / කතෘ භාගය. (R) - Registered Mark - ලියාපදිංචි ලකුණ.
(ආ) සමාජ වගකීම්.

(32) (අ) ඒකාබද්ධ වීම, අත්පත් කර ගැනීම. (ආ) තිරස් සංයෝජන, විෂම සංයෝජන.

(33) (අ) ලයිස්තුගත, ලයිස්තුගත නොවූ. (ආ) සංස්ථා, දෙපාර්තමේන්තු.

(34) (අ) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIP S), සීමා සහිත ලංකා ක්ලියර් (පෞද්) සමාගම.
(ආ) ව්‍යාපාරික ණය, පාරිභෝගික ණය.

(35) (අ) නිෂ්පාදකයාගෙන්, පාරිභෝගිකයාගෙන්
(ආ) 1. සමබර හා ප්‍රවාහන සැපයුම් සේවා පද්ධති.
2. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධිත.
3. නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම සංකීර්ණ වූ පද්ධති.
4. නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති.

(36) (අ) බැංකු අණකරය, ණයවර ලිපිය.
(ආ) ඉදිරිපෝෂණය / වැළැක්වීමේ, පසු පෝෂණය / නිවැරදි කිරීමේ.

(37) (අ) උපරිම තොග භාවිතය, උපරිම ඇණවුම් කාලය. (ආ) නිෂ්පාදන ඉංජිනේරුකරණය, නිෂ්පාදන පාලනය.

(38) (අ) කාර්‍ය පරිසරය, පුළුල් පරිසරය. (ආ) මුදල් වෙළෙඳපොළ, ප්‍රාග්ධනය වෙළෙඳපොල

(39) (අ) රැකියා විස්තරය, රැකියා පිරිවිතරය. (ආ) චේතන, දිරිදීමනා.

(40) (අ) ව්‍යාපාර අදහස, සාර්ව හා ශුක්ෂම. (ආ) ක්‍රියාවලි පිරියත, නිෂ්පාදිත පිරියත.

(41) 1. කේවල ස්වාමි ව්‍යාපාර 2. හවුල් ව්‍යාපාර 3. සංස්ථාපිත සමාගම්
4. සමුපකාර ව්‍යාපාර

(42) 1. ව්‍යවසායකත්ව අධ්‍යාපනයක් ක්‍රියාත්මක වීම. 2. දියුණු මූල්‍ය වෙළඳපොලක් තිබීම.
3. හිතකර නීතිමය රාමුවක් තිබීම.
4. දිරිගැන්වීම් ක්‍රම ඇති කිරීම. 5. යටිතල පහසුකම් සපයා තිබීම.
6. දිරි ගැන්වීම් ක්‍රම ඇති කිරීම. 7. හිතකර දේශපාලන වාතාවරණයක් තිබීම.

(43) 1. ස්වාභාවික සම්පත් බෙදීයාමේ විෂමතාව. 2. සාපේක්ෂ පිරිවැය වාසිය.
3. සමහර නිෂ්පාදිත සම්බන්දව සමහර රටවල ඒකාධිකාරයක් තිබීම. 4. භාණ්ඩ ප්‍රවර්දනය.
5. වෙළඳ බාධක අවම වීම.

(44) ● නිශ්චිත වීම. ● මැනිය හැකි වීම. ● ලගාකරගත හැකි වීම. ● යතාර්ථවාදී බව. ● නිශ්චිත කාල සීමාවක් දක්වා තිබීම.

(45) ⋆ පිරිවැය ඉහළවීම. ⋆ කුසලතා සහිත පුහුණු සේවකයින් අවශ්‍ය වීම. ⋆ විශේෂ උපකරණ හා මෙවලම් අවශ්‍ය වීම. ⋆ වෙළඳපල මුල්කරගෙන නිෂ්පාදනය සිදු නොවීම.

(46) 1. සම්බන්දතා අලෙවිකරණය. 2. සමෝධානික අලෙවිකරණය. 3. අභ්‍යන්තර අලෙවිකරණය.
4. කාර්ය සාධන අලෙවිකරණය.

(47) 1. රජයේ ගිණුම් පවත්වාගෙන යාම. 2. රාජ්‍ය ණය කළමණාකරණය. 3. රජයේ ආර්ථික උපදේශකයා වීම.
4. රජය වෙනුවෙන් අන්තර්ජාතික සංවිධාන සහ රටවල් සමඟ කටයුතු කිරීම.

(48) 1. අයදුම්පත් කැඳවීම. 2. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම. 3. බුද්ධි පරීක්ෂණ. 4. පෞරුෂ පරීක්ෂණ.
5. ප්‍රායෝගික පරීක්ෂණ. 6. වෛද්‍ය පරීක්ෂණ. 7. පසුබිම් පරීක්ෂණ.

(49) 1. මුදල් කළමණාකරණය. 2. ප්‍රාග්ධන අයවැය කරණය. 3. මූල්‍ය සැලසුම් කරණය.
4. මූල්‍ය පුරෝකථනය. 5. විගණනය.

(50) 1. ව්‍යවසායකයන් / හවුල් කරුවන් පිළිබඳ විස්තර. 2. කළමණාකරණ කුසලතා.
3. සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්. 4. සංවිධාන සටහන. 5. වාර්ෂික වියදම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

II පත්‍රය

01. (i) 1. ව්‍යාපාරයක් යනු ඕනෑම ආර්ථික කටයුත්තකි. එනම් මිනිස් අවශ්‍යතා සහ වුවමනා ඉටුකිරීමට ආර්ථික සම්පත් භාවිතා කර ඉටුකරනු ලබන දෙයකි. (ල. 01)
උදා- රජයේ පාසල් / පෞද්ගලික පාසල් / ගුරුවරු / විදුහල්පතිවරුන් ආදීන්ට වැටුපක් හිමිවන බැවින් එම ශ්‍රමය ආර්ථික ශ්‍රමය වේ. එම නිසා පාසලෙන් ආර්ථික කටයුත්තක් සිදුවේ. (ල. 01)
ආර්ථික නොවන කටයුතු ව්‍යාපාර ලෙස නොසැලකේ. එම කටයුක්ත සඳහා යොදවන ප්‍රධාන නිෂ්පාදන සාධකයන්ට අදාළ ආර්ථික ගෙවීම නොලැබීම ය. (ල. 01)
උදා - දහම් පාසල
අධ්‍යාපනය ලබාදුන්න ද නියමිත වැටුපක් නොලැබෙන බැවින් එය ආර්ථික කටයුත්තක් නොවන නිසා ව්‍යාපාරයක් නොවේ. (ල. 01)

(ii) අ) අවශ්‍යතා මිනිස් ශරීරයෙන්ම උද්දීපනය වේ. කිසිවෙකුටත් ඒවා නිර්මාණය කළ නොහැක. නමුත් වුවමනා ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකිය. එසේම වුවමනා අසීමිතය, පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ලෙස නිර්මාණය කළ හැක. මේ නිසා ව්‍යාපාරිකයන්ට වැදගත් වන්නේ අවශ්‍යතා නොව වුවමනා ය. (ල. 02)

ආ) රජය - 1) බදු සහන ලබා ගැනීමට. 2) යටිතල පහසුකම් ලබා ගැනීමට.
3) තාක්ෂණික දැනුම් ලබා ගැනීමට. (ල. 02)
ණයහිමියෝ - 1) අඛණ්ඩව අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට. 2) අඩු පිරිවැයක් යටතේ අරමුදල් සපයා ගැනීමට. (ල. 02)

(iii) අ) 1) නිෂ්පාදිත ඉක්මනින් යල් පැනීම. 2) තාක්ෂණය ලබා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.
3) තාක්ෂණය පිළිබඳ ව්‍යාපාරිකයින්ට තිබෙන දැනුම මදිකම. 4) පුහුණු සේවක හිඟය.(ල. 1/2 x 4 = 02)

ආ) (i) අඩු වටිනාකමක් ඇති ද්‍රව්‍ය ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත බවට පත් කිරීම.
උදා:- පිදුරු වලින් කඩදාසි නිපදවීම.
(ii) ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය බවට පත් කිරීම.
උදා:- භාවිතයෙන් ඉවත් කරනු ලබන වාහන තලා යකඩ බවට පත් කිරීම. (ල. 02)

(iv) අ) මෙහෙයුම් කටයුතු:-
බිස්කට් නිෂ්පාදනය සඳහා මිනිස් පාරිභෝජනයට නොසුදුසු අමුද්‍රව්‍ය භාවිතයෙන් වැලකිම, ශරීරයට අහිතකර දෑ නිපදවීමෙන් වැලකී සිටීම යනාදිය මගින් පාරිභෝගික ක්‍රියාවලියෙන් බිහි වන අපද්‍රව්‍යය නිසි ලෙස කළමනාකරණය කිරීමෙන් පරිසරය ද සුරක්ෂිත වේ. මේ තුළින් ව්‍යාපාරයේ කීර්ති නාමය වර්ධනය වේ. පාරිභෝගික විශ්වාසය තයවුරු ය. (ල. 02)

ආ) මානව සම්පත් කටයුතු :-
ආයතනයේ සේවා දායකයින් ට අදාළ ආචාර ධර්ම පිළිපැදීම තුළින් ඔවුන්ගේ අයිතිවාසිකම් කඩවීම් වළක්වාගත හැකිවේ. එමගින් ඔවුන්ගේ වෘත්තීය අනාරක්ෂිත බව මග හැරී යයි. එසේම ආයතනය තුළ විනය කඩවීම් වැළකී යයි. එය සේවක පක්ෂපාතීත්වය හා සේවක ඵලදායිතාව ඉහළ යාමට හේතු වේ. (ල. 02)

(v) අ) ● ශ්‍රී ලංකා මහ බැංකුව. ● පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය. ● ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව. ● මධ්‍යම පරිසර අධිකාරිය. ● ප්‍රවාහන කොමිෂම. ● විදුලි සංදේශන කොමිෂම.(ල. 1/2 x 4 = 02)

ආ) ⋆ පාරිභෝගික ආරක්ෂණය තහවුරු කළ හැකි වීම. ⋆ පරිසරය ආරක්ෂා කරගත හැකි වීම.
(මෙම කරුණු දෙක කෙටියෙන් පැහැදිලි කළ යුතුය.)

02. (i) අ) <u>පූර්ණ සේවා නියුක්තිය</u>
සම්පත් උපයෝජනය / රැක්යා අවස්ථා ලබාදීම කරුණු දෙකට අදාළව කෙටි පැහැදිලි කිරීමට (ල. 01)
<u>ආර්ථික ස්ථායිතාවය</u>
අභ්‍යන්තර මිල සහ භාහිර මිල ස්ථායිතාවය කරුණු දෙකටම අදාළව කෙටි පැහැදිලි කිරීමට (ල. 01)

ආ) 1. පූර්ණ සේවා නියුක්තිය
A රැකියා අවස්ථා සැපයීම
B සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතය (ල. 01)

2. ආර්ථික ස්ථායිතාවය
A දේශීය භාණ්ඩ / සේවා මිල ස්ථාවරව තැබීම
B වැඩිපුර අපනයන වෙළඳාමට යොමුවීම
C ආනයන අවම කිරීම (ල. 01)

(ii) අ) ● ලාභ ලැබීමේ අරමුණක් තිබීම. ● ව්‍යාපාර කටයුත්තක් පැවතීම. ● පුද්ගලයින් සිටීම.
● අන්‍යෝන්‍ය සබඳතාවන් (ඒකගතාවක්) තිබීම. (කරුණු 04 ට ලකුණු 02)

ආ) ● යම් රටක සමාගමක් ලෙස සංස්ථාපනය කර එම රටින් පිටත ව්‍යාපාර කටයුතු කරගෙන යාමට පමණක් අවසර හිමිවන සමාගම් අස්වෙරළ සමාගම් වේ.
● ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගතහොත් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කරන සමාගමකට ලංකාවෙන් පිටත පමණක් ව්‍යාපාර කටයුතු කරගෙන යා හැකි වේ.
● විදේශීය සමාගම් යනු මුල් ලියාපදිංචිය වෙනත් රටක සිදු කර ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු සිදුකරන සමාගම් වේ. (ල. 02)

(iii) අ) ''සමාගමක්'' යන මූලික අදහසට පටහැනි වේ. (ල. 01)
සමාගමක් යනු 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ සංස්ථා ගතකරන ලද පුද්ගයින්ගේ එකතුවක් වේ. එක් පුද්ගලයෙක් සමාගමක් ආරම්භ කිරීම පුද්ගලයන්ගේ එකතුවක් යන අදහසට පටහැනි වේ. (ල. 01)

ආ) 1. සමාගමේ පරමාර්ථ පැහැදිලි කරයි.
2. සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්
3. සමාගමේ කළමනාකරණය හා පරිපාලනයට අදාළ කරුණු පැහැදිලි කරයි

(iv) අ) ● තම හැකියා හා කුසලතා පිළිබඳව අධ්‍යයනය කිරීම හා ඇගයීම. ● නිෂ්පාදිතයට ඇති වෙළඳපොල හා එම වෙළඳපොලට ලගාවිය හැකි ද යන්න. ● ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යයනය කිරීම. ●ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කිරීම. ● ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳව අධ්‍යයනය. ● ව්‍යාපාර පිළිබඳව පවතින නීතීරීති පිළිබඳව. ● පවතින තරගකාරිත්වය පිළිබඳව.
(කරුණු 04 කට ලකුණු 02)

ආ) ● ව්‍යාපාරිකයින්ගේ උනන්දුව හා කැපවීම. ● ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබීම. ●මූල්‍ය හා බදු සහන වැනි දිරි ගැන්වීම්. ● වර්තමානයේ පුළුල් වෙළඳපොළක් පැවතීම. ● විවිධ ආයතනික හා අලෙවි පහසුකම් ලබා දීම. (කරුණු 04 ට ල. 02)

(v) අ) 1. විභාග කේන්ද්‍ර කරගත් මෙරට අධ්‍යාපනය නිර්මාණශීලී පුද්ගලයින් බිහි නොකිරීම.
2. සමාජමය ආකල්ප ව්‍යවසායකයින් කෙරෙහි සෘණවාදී වීම.
3. සේවා අංශයේ රැකියාවන් හා වෘත්තීන් සඳහා සමාජයේ ඇති ඉල්ලුම
4. බිහිවන ව්‍යවසායකයින් සඳහා ද දේශපාලනයෙන් සිදුවන අහිතකර බලපෑම
5. රජයෙන් ලැබෙන දායකත්වය ප්‍රමාණවත් නොවීම
6. ආර්ථික අවපාත නිසා ආයෝජනයට මුදල් නොමැති වීම
7. ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති වීම

ආ) <u>සමාජ ව්‍යවසායකත්වය</u>
කෙටි පැහැදිලි කිරීමට (ල. ½)
උදා- මොහොමඩ් යුනුස් - බංග්ලාදේශය
ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ප්‍රථමවරට හඳුන්වා දීම
ලීක්වාන් යූ - සිංගප්පූරු හිටපු ජනාධිපති
මොහොමඩ් බින් රාෂිඩ් අල් මක්තුවම් - ඩුබායි නගරයේ පාලකයා
හෝ වෙනත් ඕනෑම උදාහරණයකට (ල. ½)

<u>අභ්‍යන්තර ව්‍යවසායකත්වය</u>
කෙටි පැහැදිලි කිරීමට (ල. ½)
උදා- පබිලිස් සිල්වා - ප්‍රධාන සූපවේදී ගලධාරි හෝටලය
(වෙනත් උදාහරණයකට ද ලකුණු දෙන්න.) (ල. ½)

03. (i) අ) ● විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම. ● වටිනා කම මැනීමේ මිනුම් දණ්ඩක් වීම.(කරුණු 02 කට ල. 02)

ආ) 1. වාණිජ බැංකු වලට අවසාන ණය දෙන්නා ලෙස කටයුතු කිරීම. 2. වාණජ බැංකු වලට අවශ්‍ය උපදෙස් හා අනෙකුත් සේවා සැපයීම. 3. වාණිජ බැංකු වලට ගෙවීම් හා පියවීම් පහසුකම් සැපයීම. 4. වාණිජ බැංකු අධීක්ෂණය කිරීම. 5. පොලී අනුපාත, ව්‍යවස්ථාපිත සංචිත අනුපාත හා විවිධ වෙළඳපොළ කටයුතු මගින් වාණිජ බැංකු හැසිරවීම. (කරුණු 4 ට ල. 02)

(ii) අ) ආයෝජන කළමනාකරණ සමාගම, ආයෝජකයින්ගේ මුදල් ආයෝජනය කිරීමේ දී අවධානම අවම කිරීම සඳහා විවධාංගීකරණය වූ ආයෝජන මාර්ගවල ආයෝජනය කිරීමයි.



ආ) 1. ආයෝජන අරමුදල් ආයෝජන කළඹක ආයෝජනය කරන බැවින් අවධානම අවම වී ප්‍රතිලාභ ලැබීම.
2. ඉහළ වෙළඳපොල ප්‍රාග්ධනීකරණයක් සහිත සමාගම්වල මුදල් ආයෝජනය වන බැවින් ලාභ ලැබීමේ සම්භාවිතාව ඉහළ වීම. (ල. 02)

(iii) අ) ● විවිධ ආකර්ෂණය ණය ක්‍රම හඳුන්වාදීම. ● විවිධ ආකර්ෂණීය ඉතිරිකිරීමේ ගිණුම් හඳුන්වා දීම.
● බැංකු සේවා පුළුල් කිරීම හා කුඩා බැංකු ඇරඹීම. ● හඬ ටෙලර්පත්, ණයපත්, හරපත් හඳුන්වාදීම.
● රක්ෂණ සේවා, කල්බදු සේවා සහ වෙළඳ සේවා වැනි විවිධ අංශ වෙත යොමු වීම.
● ඉලෙක්ට්‍රෝනික් මුදල් පැවරුම් ක්‍රම හඳුන්වාදීම. (කරුණු 4 ට ල. 02)

ආ) හරිත බැංකුකරණය
සියලු බැංකු කටයුතු ඉලෙක්ට්‍රෝනික් ආකාරයට සිදුකිරීමට පහසුකම් සැලසීම මගින් කොළ භාවිතය අවම කිරීමත්, එමගින් කොළ නිෂ්පාදනයට ශාක භාවිතය අවම කිරීම මගින් පරිසරය ආරක්ෂා කිරීම (ල. 02)

(iv) අ) 1. රක්ෂණය මගින් ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් යොමු වීම.
2. රක්ෂණ සමාගම් විවිධ ආයෝජන කටයුතු වල යෙදීම.
3. මුහුදු උවදුර රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළෙඳාම දියුණු වීම.
4. විවිධ රක්ෂණ ක්‍රම හඳුන්වාදීම තුළින් ව්‍යාපාර කටයුතු පුළුල් වීම.
5. මූල්‍ය වෙළෙඳපොල දියුණු වීම.
6. අවදානම වැඩි පිරිසක් අතර බෙදීයාම නිසා අවදානම තුනී කර ගත හැකි වීම. (කරුණු 4 ට ල. 02)

ආ) 1. වත්කම් වල ගත්මිල සහ වෙළෙඳ අගය. 2. රක්ෂණ හිමිකම තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු. 3. සම්බන්ධ වී ඇති ගිවිසුම් පිළිබඳ විස්තර. (ල. 02)

(v) අ) **වාචික** - ● ශබ්ද විකාශන යන්ත්‍ර, ● අභ්‍යන්තර රැසවීම්
වාචික නොවන - ● සීනුව ● දැන්වීම් පුවරුව.

ආ) පණිවිඩයක තිබිය යුතු මූලික ගුණාංග ඇතුළත් ග්‍රාහකයාගෙන් ක්ෂණිකව අපේක්ෂිත ආකාරයට ප්‍රතිචාරයක් ලබාගත හැකි සන්නිවේදන බාධා වලින් තොර සන්නිවේදනයයි.

04. (i) (1) නිෂ්පාදිත අඛණ්ඩව වෙළඳපොළට සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.
(2) සියළුම කාර්යයන් සැලසුම් සහගතව සිදු කිරීම නිසා නාස්තිය හා අපතය අවම වීම තුළින් පිරිවැය අවම කර ගත හැකි වීම.
(3) තරඟකාරීත්වයට ශක්තිමත්ව මුහුන දීමට හැකිවීම.
(4) යන්ත්‍ර සූත්‍ර සේවකයින් වෙනුවෙන් දැරීමට සිදුවන අක්‍රිය පිරිවැය අවම කර ගත හැකි වීම.
(5) නිෂ්පාදිතවල ගුණත්වය ආරක්ෂා කර ගත හැකි වීම.
(6) කර්මාන්තය තුළ නායකයා බවට පත් විය හැකි වීම.
(7) අපද්‍රව්‍ය කළමණාකරණය නිසි පරිදි සිදු වීමෙන් ගැටළු මතු නොවීම.
(කරුණු 4 ක් නම්කර 02 ක් පැහැදිලි කිරීමට ලකුණු 04)

(ii) අ) 1. ණය කාඩ්පත. 2. අන්තර්ජාල පෙර ගෙවුම් පහසුකම්. (නම්කර පැහැදිලි කිරීමට ල. 02)

ආ) 1. ආනයන පංගු ක්‍රමය. 2. දැඩි විනිමය පාලන ක්‍රම. 3. ආනයන අපනයන තහනම් කිරීම.
4. වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.

(iii)
- අදාළ සුපිරි වෙළඳ සැලෙහි වෙබ් අඩවියට පිවිසීම.
- අවශ්‍ය භාණ්ඩ තෝරා එම භාණ්ඩ අදාළ ස්ථානයට (Shopping Cart) එකතු කරන්න.
- භාණ්ඩ තෝරා අවසානයේ දී Checkout / pay තෝරන්න.
- ඔබෙන් ඉල්ලා සිටින ඔබේ ලිපිනය හා අනෙකුත් විස්තර ලබා දෙන්න.
- ඉන්පසු ඔබේ ගෙවීම් විස්තර (Payment details) ඇතුළත් කර ගෙවීමට අදාළ කටයුතු සිදු කර (විද්‍යුත් මුදලට අදාළව) ගනුදෙනුව අවසන් කරන්න.
- සාර්ථකව ගනුදෙනුව අවසන් කළ විට ඒ බව කෙටි පණිවිඩයකින් හා විද්‍යුත් තැපැල් පණිවිඩයකින් තහවුරු කරනු ඇත.
- අවසානයේ පොරොන්දු වූ කාල රාමුව තුළ ඇණවුම් කළ භාණ්ඩ නිවසටම ගෙනවිත් භාරදීම සිදු වේ. (ඒ ඒ ආයතනය අනුව ඉහත පියවර වල යම් යම් වෙනස්කම් සිදුවිය හැකිය.) (ලකුණු 4)

(iv) අ) ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකඟ වෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපියයි. (ල. 02)

ආ) (1) කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංවර්ධනය. 2. විදුලි සංදේශ, විද්‍යාව, තාක්ෂණය හා දේශගුණික විද්‍යාව. 3. සෞඛ්‍යය හා ජනගහන කටයුතු. 4. ප්‍රවාහනය. 5. මානව සම්පත් සංවර්ධනය.
(කරුණු 4 ක් නම් කිරීමට ලකුණු 02)

(v) අ) ගොවීන්ගේ නිෂ්පාදන හා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය අළෙවි කිරීමට ගොවීන්ට පහසුකම් සලසා දීම සඳහා රජය මගින් ඉදිකර ඇති අළෙවි මධ්‍යස්ථාන ආර්ථික මධ්‍යස්ථාන වේ. (ල. 01)
උදා - දඹුල්ල / මීගොඩ / කැප්පෙටිපොළ / බණ්ඩාරවෙල / නාරාහේන්පිට / යාපනය / තඹුත්තේගම
(පිළිගත හැකි වෙනත්) (ල. 01)

ආ) 1. ගොවීන්ට තම නිෂ්පාදන සෘජුවම අළෙවි කිරීමට හැකිවීමත්, එමගින් ඉහළ ආදායමක් ලැබීම නිසා ගොවීන් තෘප්තිමත් වීම.
2. අතරමැදියන් අවම වීමෙන් පාරිභෝගිකයාට අඩු මිලට භාණ්ඩ මිලදී ගත හැකි වීම.
3. භාණ්ඩ බෑම හා පැටවීම අවම වීමෙන් නිෂ්පාදනවලට සිදුවන තැලීම් පොඩිවීම් අවම වීම.
4. අඩු කාලයක දී භාණ්ඩ නිෂ්පාදකයින්ගේ පාරිභෝගිකයාට භාණ්ඩ ලබාගතහැකි වීම.
5. රටතුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම කාර්යක්ෂම වීම.
6. රටේ අත්‍යවශ්‍ය ආහාරවල මිල ප්‍රසස්ථ මට්ටමක පවත්වා ගැනීමට දායක වීම. (ල. 02)

05. (i) ● අන්තර් පුද්ගල භූමිකා - ★ ආයතන ප්‍රධානියෙකුගේ භූමිකාව. ★ නායකයෙකුගේ භූමිකාව.
★ සබඳතා පවත්වන්නෙකුගේ භූමිකාව.
● තොරතුරු භූමිකාව - ★ තොරතුරු නියාමකයෙකුගේ භූමිකාව. ★ තොරතුරු බෙදාහරින්නෙකුගේ භූමිකාව.
★ මාධ්‍ය ප්‍රකාශකයෙකුගේ.
● තීරණ භූමිකා. - ★ ව්‍යවසායකයෙකුගේ භූමිකාව. ★බාධා පාලනයකරන්නෙකුගේ භූමිකාව.
★ සම්පත් බෙදා දෙන්නෙකුගේ භූමිකාව. ★ සාකච්ඡා කරන්නෙකුගේ භූමිකාව.
(ප්‍රධාන භූමිකා 03 ට ලකුණු 01 යි. උප භූමිකා 10ට ලකුණු 03 යි.)

(ii) ● පරමාර්ථ ස්ථාපිත කිරීම. ● අරමුණු හා උපායමාර්ග - හඳුනාගැනීම. ● පරිසර විශ්ලේෂණය.
● සම්පත් විශ්ලේෂණය. ● අවස්ථා හා තර්ජන හඳුනාගැනීම. ● කාර්යසාධන පරාසය හඳුනාගැනීම හා විශ්ලේෂණය. ● උපක්‍රමික තීරණ ගැනීම හා සැලැස්ම සකස් කිරීම. ● උපායමාර්ග ක්‍රියාත්මක කිරීම. ● සාර්ථකත්වය මැන බැලීම හා පාලනය. (නිවැරදි අනුපිළිවෙල සහිත ක්‍රියාවලියට ලකුණු 04 යි)

(iii) ● සංවිධානයක ඉහළ කළමණාකරණයේ සිට පහළ කළමණාකරණය තෙක් නොහැඩුණු අධිකාරිත්ව මාර්ගය අණ කිරීමේ ද්‍රව්‍යය වේ. (ල. 01)
● එක් සේවකයෙකු එක් සුපරීක්ෂකවරයෙකුට පමණක් වගකිව යුතුය. යන මූලධර්මය අණ කිරීමේ ඒකියතාවය නම් වේ. (ල. 01)
● එක් කළමණාකරුවෙකුට සෘජුවම වාර්තා කරනු ලබන සහයකයින් සංඛ්‍යාව පාලන විහස්තිය නම් වේ. (ල. 01)
● අණ කිරීමට, සම්පත් බෙදා දීමට හෝ විවිධ කාර්යයන් සඳහා සංවිධානයක කළමණාකරුවෙකුට ලැබෙන නිත්‍යානුකූල බලය අධිකාරිත්වය වේ. (ලකුණු 01)

(iv) ★ කාර්‍යක්‍ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා අවශ්‍ය භෞතික පහසුකම් එනම් කාර්ය මධ්‍යස්ථාන, ද්‍රව්‍ය, යන්ත්‍ර උපකරණ, සහය සේවා ආදිය සැලසුම් කිරීම කම්මල් පිරියන සැලසුම් කිරීම නම් වේ. (ලකුණු 02)
★ ක්‍රියාවලි පිරියත. ★ නිෂ්පාදිත පිරියත. ★ කුටි පිරියත. ★ ස්ථාවර ස්ථානීය පිරියත. (ලකුණු 02)

(v) අ) නිෂ්පාදන ආයතනයක නිෂ්පාදනය සමච්ඡේද ලක්ෂයේ පැවතීම ලාභ හෝ පාඩු නැති අවස්ථාව වේ. යම් යම් හේතු මත නිෂ්පාදනය සමච්ඡේද ලක්ෂයෙන් පහතට ගියහොත් ආයතනය පාඩු ලබයි. එබැවින් සමච්ඡේද ලක්ෂයෙන් දකුණට යම් සීමාවක නිෂ්පාදනය පවත්වා ගත යුතුය. ආයතනයට සැබවින්ම ලාභ ලැබිය හැක්කේ එයින් දකුණට ඇති සීමාවේ ය. (ල. 01)



(ලකුණු 01)

ආ) 1. යන්තෝපකරණ ක්‍රියා විරහිත විය හැකි වීම.
2. අමුද්‍රව්‍ය නියමිත පරිදි නොලැබී යා හැකි වීම.
3. විදුලි බිඳවැටීම්
4. සේවක වැඩවර්ජන
5. හදිසි ආපදා තත්ත්වයන්
6. වෙනත් අනපේක්ෂිත සිදුවීම් (ල. 02)

06. (i) ආයතනයික තොග සම්බන්ධ මුළු පිරිවැය අවම වන පරිදි වරකට ඇණවුම් කළ යුතු තොග ඒකක ප්‍රමාණය ආර්ථික ඇණවුම් ප්‍රමාණය EOQ නම් වේ. ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ දී ඇණුවුම් කිරීමේ පිරිවැයත් තොග පවත්වාගෙන යාමේ පිරිවැයත් එකිනෙකට සමාන විය යුතුය. (ලකුණු 02)



(ලකුණු 01)

ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ දී තොග සම්බන්ධ මුළු පිරිවැය අවම වීමක් සිදුවන අතර ඒ අනුව අවම තොග පිරිවැයක් යටතේ ගෙන්විය යුතු ප්‍රශස්ථතම තොග ප්‍රමාණය ආර්ථික ඇණවුම් ප්‍රමාණය වේ. (ල. 01)

(ii) අ) (i) නිෂ්පාදන සංකල්පය. (1) නිෂ්පාදනය හැකිතාක් වර්ධනය කිරීම / කාර්යක්ෂම කිරීම.
(2) අඩු පිරිවැය.
(3) බෙදා හැරීම වඩත් පුළුල් ව හා කාර්යක්‍ෂමව සිදු කිරීම.

(ii) නිෂ්පාදිත සංකල්පය. (1) සිය අභිමතය පරිදි ආයතනයේ නිෂ්පාදිත වල ගුණත්වය පිලිබඳ අවධානය යොමු කිරීම.
(2) සිය නිෂ්පාදිතයක් සුපිරි තත්ත්වයට පත් කිරීමට අඛණ්ඩව තම කාලය හා ශ්‍රමය වැය කරමින් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම.
(කරුණු 02 ට ලකුණු 02)

ආ) ● මැනිය හැකි වීම. ● ළඟා විය හැකි බව (ප්‍රවේශ විය හැකි බව). ● ප්‍රමාණවත් බව. ● වෙන් කොට හඳුනා ගත හැකි බව. ● ක්‍රියාත්මක කළ හැකි බව. (කරුණු 04 ට ලකුණු 02)

(iii) කිසියම් විකුණුම්කරුවකු විකිණීමට ඉදිරිපත් කරන නිෂ්පාදිත කළඹ නිෂ්පාදිත මිශ්‍රය වේ. නිෂ්පාදිත මිශ්‍රය පළලිකින්, දිගකින්, ගැඹුරකින් හා සංගත භාවයකින් සමන්විත යි.
පළල :- ආයතනය සතු නිෂ්පාදන පළලවල් ගණන වේ.
දිග :- සියලුම භාණ්ඩ පෙළවල අන්තර් ගත නිෂ්පාදිත ගණන වේ.
ගැඹුර :- එක නිෂ්පාදිත වර්ගයක් යටතේ ඉදිරිපත් කරන අයිතම සංඛ්‍යාව වේ.
සංගත භාවය :- භාණ්ඩ වර්ග අතර ඇති සම්බන්ධතාව. (හැඳින්වීමට ලකුණු 01 පැහැදිලි කිරීම ලකුණු 01)

(iv) අ) ඍජු ප්‍රතිලාභ
1. ලාභාංශ 2. පොලී ලැබීම්
3. සංචිත ප්‍රාග්ධනීකරණය 4. හිමිකම් නිකුතුව
5. ප්‍රාග්ධන ලාභ (ල. 02)

වක්‍ර ප්‍රතිලාභ
1. සාමාන්‍ය කොටස් හිමියන්ට සමාගමේ අධ්‍යක්ෂකවරුන් ලෙස පත්වීමට අවස්ථාව ලැබීම.
2. ඡන්ද හිමිකම
3. ණය ලබාගැනීමට ඇපයක් ලෙස සුරකුම්පත් භාවිතා කළ හැකි වීම.
4. සුරකුම්පත්වල ආයෝජනය අවදානම අවම වීම.
5. ද්‍රවශීලතාවය ඉහළ වීම.
6. ප්‍රාග්ධන ලාභ බදුවලින් නිදහස් වීම. (ල. 02)

ආ) ඉහත ඍජු ප්‍රතිලාභ දෙකක් කෙටියෙන් පැහැදිලි කිරීමට (ලකුණු 1 බැගින් 2 යි)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(v) අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ භාරකාර බැංකුවක් මගින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් ආරම්භ කර එමගින් කොටස් මිලදීගෙන ආයෝජනය කළ හැකිය. (ල. 02)

ආ) 1. මෙරට හෝ විදේශයන්හී ජීවත් වන අවුරුදු 18 ට වැඩි විදේශීය පුද්ගලයින්
2. විදේශයන්හී ජීවත්වන අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකිකයින්
3. විදේශයන්හි සංස්ථාගත කරන ලද සමාගම්
4. සුරකුම්පත් හා විනිමය කොමිසන් සභාව අනුමත කළ කලාපීය අරමුදල් (ල. 02)

07. (i) අ) 1. ලාභය උපරිම කිරීම. 2. කොටසක ඉපයුම උපරිම කිරීම.
3. දිගුකාලීන මුල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම. 4. ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම.
(කරුණු 04 ට ලකුණු 02)

ආ) 1. කොටස් නකුතුව. 2. ණයකර නිකුතුව. 3. කල් බදු. 4. දිගුකාලීන බැංකු ණය.(කරුණු 4 ට ලකුණු 02)

(ii) ⋆ අවශ්‍ය අරමුදල් ප්‍රමාණය. ⋆ අරමුදල් අවශ්‍ය වන කාලය. ⋆ පිරිවැය.
⋆ ව්‍යාපාර සංවිධානයේ ස්වභවය. ⋆ තැබිය යුතු ඇප සුරැකුම් පිළිබඳ තත්වය.
⋆ ව්‍යාපාරයේ ප්‍රාග්ධන ව්‍යුක්තිය මත බලපෑම. ⋆ අරමුදල් යොදවන ව්‍යාපෘතියේ ස්වභාවය හා ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ. ⋆ ව්‍යාපාරයේ කළමනාකරණයට සිදුවන බලපෑම. (කරුණු 4 ට ලකුණු 04)

(iii) **පුහුණුව**
- වර්තමාන රැකියාවේ කටයුතු රාජකාරි හා වගකීම් ඉටු කිරීමට සේවකයා සූදානම් කරයි.
- සාපේක්ෂව කෙටිකාලීන වැඩ සටහනකි.
- පිරිවැය අඩුයි.
- පටු පරාසයක වැඩ සටහනකි.
- කාලීන අවශ්‍යතා ඉටු කිරීමට ප්‍රතික්‍රියා දැක්වීමේ ක්‍රියාවලිය වේ.

සංවර්ධනය
⋆ අනාගත රැකියා, කටයුතු, රාජකාරී හා වගකීම් ඉටු කිරීමට සේව්‍යයා සූදානම් කරයි.
⋆ සාපේක්ෂව අඛණ්ඩව පවත්වාගෙන යන දිගුකාලීන වැඩ සටහන්.
⋆ පිරිවැය වැඩියි.
⋆ පුළුල් පරාසයක වැඩ සටහනකි.
⋆ අනාගත අවශ්‍යතා ඉටු කිරීමට පූර්ව ක්‍රියා දැක්වීමේ ක්‍රියාවලියකි.(වෙනස්කම් 04 ට ලකුණු 04)

(iv) අ)
- වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂක උපද්‍රව අවම කර ගැනීමට හැකි වීම.
- සේවාදායක සෞඛ්‍යය හා ආරක්ෂාව සම්බන්ධයෙන් සංවිධාන වලට මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු වලින් මිදීමට හැකි වීම.
- ආයතනයේ කාර්‍යක්ෂමතාව ඉහළ නැංවීමට දායක වීම.
- ආයතනයේ ප්‍රතිරූපය ඉහළ යාම. (කරුණු 04 ට ලකුණු 02)

ආ) කිසියම් වෘත්තිය ප්‍රශ්නයක් හේතු කොට ගෙන සේවායෝජකයන් හා සේවකයන් අතර හෝ සේවකයන් සේවකයන් අතර හෝ ඇතිවන ගැටුම් හෝ හේතු කාර්මික ආරවුල් ලෙස හැඳින් වේ.
හේතු
- රක්ෂාව දීම හෝ නොදීම. • සේවා නියමයන් සම්බන්ධව. • සේවා තත්වයන් පිළිබඳව
(පැහැදිලි කිරීමට ල.01 වෙනත් පිළිගත හැකි කරුණු සහිතව හේතු වලට ල. 01)

(v) අ) ධනවාදී ආකල්ප හා හැකියාවන්ගෙන් යුක්ත ආයතනයේ ඉලක්ක පරමාර්ථ ළඟාකර ගැනීමට සහාය වන රැකියා අපේක්ෂකයින් ආයතනයට ආකර්ෂණය කරගැනීමේ ක්‍රියාවලියයි. (ල. 01)
1. රැකියා පුරප්පාඩු හඳුනා ගැනීම
2. රැකියා නියමයන් අධ්‍යයනය කිරීම
3. ආකර්ශනයට බලපාන සාධක හඳුනාගැනීම
4. අයදුම්පත්‍රය සකස් කිරීම
5. ආකර්ශන මාර්ගය තීරණය කිරීම
6. ක්‍රියාත්මක කිරීම
7. ඇගයීම (ල. 01)

ආ) අභ්‍යන්තර ආකර්ශන මාර්ගවල වාසි
1. සේවකයන් අභිප්‍රේරණය වීම.
2. හොඳ සේව්‍ය සේවක සම්බන්ධතා නිර්මාණය වීම.
3. වඩාත් යෝග්‍ය සේවකයින් රඳවා ගත හැකි මවී.
4. සේවක ආකර්ශනයේ පිරිවැය අවම වීම.

භාහිර ආකර්ශන මාර්ගවල අවාසි
1. දැනට ඉන්නා සේවකයින්ගේ අභිප්‍රේරණය අඩුවීම.
2. සේවක ආකර්ශන වියදම් ඉහළ යෑම.
3. සේවක ආකර්ශනයට වැඩි කාලයක් ගතවීම. (ල. 01)

08. (i) අ) ● වර්ගීකරණය. ● තේරීම. ● ගණනය කිරීම. ● සාරාංශකරණය. (කරුණු 04 ට ලකුණු 02)

ආ) ⋆ විස්තරාත්මක බව. ⋆ විශ්වාස දායක බව. ⋆ නම්‍යශීලී බව. ⋆ නිවැරදි බව. ⋆ ලබා ගැනීමේ පහසුව. ⋆ කාලීන බව. ⋆ සංසංදනය කළ හැකි බව. ⋆ පිරිමැසුම් බව. ⋆ අවබෝධ කරගත හැකි බව. ⋆ පූර්ණ බව. ⋆ අදාල බව. (කරුණු 04 ට ලකුණු 02)

(ii) අ) විශාල දත්ත (Bigdata)

රටාවන්, නව ප්‍රවණතාවයන් හා සම්බන්ධතාවයන් හඳුනාගැනීම සඳහා භාවිතා කරන හෝ පරිගණක ඇසුරෙන් විශ්ලේෂණය කරන විශාල දත්ත සමූහයන්

මේවා සංඛ්‍යාත්මකව විශාල අතර කළමනාකරණය කිරීම දුෂ්කරය. (ල. ½)

උදා - වෛද්‍ය වාර්තා දත්ත / සමාජ ජාල දත්ත / ජංගම දුරකථන භාවිත මෘදුකාංග / පාරිභෝගික පදනම් දත්ත) (ල. ½)

පාර දත්ත (Metadata)

වෙනත් දත්තයන්ට අදාළව දත්ත විස්තර කරන හෝ තොරතුරු ලබාදෙන දත්ත වේ. මේවා ව්‍යුහගත දත්තයන් වන අතර අනෙකුත් දත්ත භාවිතය, විස්තර කිරීම හෝ කළමනාකරණය පහසු කරයි. (ල. ½)

උදා පුස්තකාලවල ඇති පොත් තොරතුරු නාමාවලිය (ල. ½)

ආ) කෘතීම බුද්ධිය

කෘතීම බුද්ධය යනු මිනිසුන් මෙන් ක්‍රියා කරන මෘදුකාංග හෝ යන්ත්‍රවල ගැබ්ව ඇති බුද්ධියයි.

උදා- 1 ස්වයං රිය පැදවීමේ මෝටර් රථ උත්පාදක හෝ නිර්මාණාත්මක මෙවලම්

2 වසර කිහිපයකට හෝ දහස් ගණනකට පෙර විසූ පුද්ගලයින්ගේ හඬ යොදාගෙන වෙළඳ දැන්වීම් නිර්මාණය කිරීම.

3. Chatgpt මෘදුකාංගය

(iii) අ) ● අදාල පාර්ශවයන්ට නිවැරදිව තොරතුරු සන්නිවේදනය කිරීම. ● නිෂ්පාදිත ගුණත්වය ඉහළ නංවාලීමට සහය වීම. ● ආයතනයේ පිරිවැය අවම කිරීමට සහය වීම. ● තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීමේ වාතාවරණයක් සැලසීම. ● කළමණාකරණ කාර්යයන් හි සාර්ථක භාවය තහවුරු කිරීම. ● අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී අවශ්‍ය පාර්ශවයන්ට අදාල තොරතුරු ලබා දීම. (කරුණු 04 ට ල. 02)

ආ) තොරතුරු පද්ධති

- උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධති ල.1/2
  - විධායක උපකාරක පද්ධති ල. 1/2
- කළමණාකරන මට්ටමේ තොරතුරු පද්ධති ල. 1/2
  - කළමණාකරණ තොරතුරු පද්ධති
  - තීරණ උපකාරක පද්ධති ල. 1/2
- දැනුම් මට්ටමේ තොරතුරු පද්ධති ල. 1/2
  - දැනුම් කාර්‍යය පද්ධති
  - කාර්යාල ස්වයංකරණ පද්ධති ල. 1/2
- මෙහෙයුම් මට්ටමේ තොරතුරු පද්ධති ල. 1/2
  - ගනුදෙනු සැකසුම් පද්ධති ල. 1/2 ල. 01

(මුළු ලකුණු 02)

(iv) අ) ● පැහැදිලි ඉම. ● ගනුදෙනුකරුවෝ. ● ඉලක්ක. ● අවශ්‍ය මූල්‍ය සම්පත්. (ල. 02)

ආ) ව්‍යාපාර සැලැස්මක ඇතුලත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස විධායක සාරාංශය ලෙස හැඳින්වේ. සැලැස්ම කියවන්නාට සමස්ත සැලැස්ම පිළිබඳව දළ අවබෝධයක් ලබා දෙන කොටස මෙය වන අතර මෙය සැම විටම කෙටි හා ආකර්ෂණීය විය යුතු ය. (ල. 02)

(v) අ) ● ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රමාණ නිගමනය කිරීමට හා සම්පාදනය කිරීමට. ● ව්‍යාපාරයේ අරමුදල් ආයෝජනය කිරීම පිළිබඳ තීරණ ගැනීමට. ● මුදල් ඌනතාවයක් ඇති විය හැකි කාලය හඳුනාගෙන ඊට පිළියම් යෙදීමට. ● මුදල් අතිරික්තයක් ඇතිවන කාලය හඳුනාගෙන ඒ මුදල් ඵලදායි කටයුතු වල යෙදවීමට. (ල. 02)

ආ) ⋆ ව්‍යාපාරයේ නම හා ලිපිනය. ⋆ ව්‍යාපාරයේ පරමාර්ථ හා අරමුණු. ⋆ ආදී කර්තෘවරු. ⋆ සංවිධාන ව්‍යුහය. ⋆ සංවිධාන ක්‍රමය, ⋆ අධ්‍යක්ෂ මණ්ඩලය. ⋆ භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර. (ල. 02)